

# ලෝකාලෝකය

## 2021 සැප්තැම්බර් - නොවැම්බර් කලාපය

දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව, සියලු යහපත් ක්‍රියාවලට සූදානම්ව සිටින පිණිස. දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත් තරවටුවටත් හික්මවීමටත් ධර්මිෂ්ඨකම ගැන ගුරුකම්දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ

(2 තිමෝති 3:16).


**ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය**

අංක - 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 06.

දුරකථන අංක : 011 2581901




# කතා කරන්න! සවන් දෙන්න!

ආදරණීය දුවේ පුතේ, පුංචි ඔයාලා හැමෝම දෙවිපියාණන්ගේ ප්‍රේමයෙහි ඉතා සුරක්ෂිතව සිටින නිසා උන්වහන්සේට ප්‍රශංසා වේවා!

දුවේ පුතේ, අපේ දෙවිපියාණන්වහන්සේ අපට බොහෝ ප්‍රේමකරන, අප ගැන සලකන තැණැන්වහන්සේ බව දන්නවාද? උන්වහන්සේ අප ගැන සලකන, අපගේ හඬ අසන, අප දෙස බලා සිටින තැනැත්තාය. ශුද්ධ බයිබලයෙහි **නික්මයාම 3:7** පදයෙහි මේ ගැන සඳහන්ව තිබෙනවා. මේ කාලය වන විට ඉශ්‍රායෙල් ජනතාව මිසර දේශයේ ජීවත් වුන අතර ඔවුන් වහලුන් මෙන් ජීවත් විය. මෙම ජනතාව මුදවා ගන්නා පිණිස දෙවියන්වහන්සේ මෝසෙස්ට එළිදරව් වුන අවස්ථාවේදී උන්වහන්සේ මෙසේ පැවසූ සේක. **"මිසරයේ වසන මාගේ සෙනඟගේ පීඩාව සැබවින්ම දුටිමි, ඔවුන්ගේ විධානවරුන් නිසා ඇති ඔවුන්ගේ මොරගැසීම ඇසීමි; මක්නිසාද ඔවුන්ගේ දුක දනිමි" (නික්මයාම 3:7).**

බලන්න දුවේ පුතේ උන්වහන්සේ පවසන දේ... උන්වහන්සේ ඔවුන්ගේ පීඩාව දැක, මොරගැසීම අසා, දුක හඳුනාගත්තා නැතහොත් උන්වහන්සේට ඔවුන්ව දැනුනා. සැබවින්ම දෙවියන්වහන්සේ අද ඔබ දෙස බලා සිටින සේක. උන්වහන්සේ ඔබගේ හඬ අසා සිටින සේක. ඔබව හොඳින් හඳුනන සේක. ඉතින් ආදර දරුවෙනි ඔබ කරන සෑම දෙයක්ම දෙවිපියාණන්වහන්සේ බලා සිටින බව සැම විටම සිහිතබා ගන්න. එම නිසා ඔබගේ ක්‍රියාවලින් උන්වහන්සේව ප්‍රසන්න කරන්න. ඔබගේ මිතුරු මිතුරියන් අතර ඔබගේ ක්‍රියාව වෙනස් ආකාරව උන්වහන්සේගේ නාමයට ගෞරවය ගෙන දෙන ආකාරයට හැසිරෙන්න.

එලෙසම උන්වහන්සේ ඔබගේ හඬ අසා සිටින බැවින් නිරන්තරයෙන් යාච්ඥාවෙන් උන්වහන්සේට හඬගසන්න. ඔබගේ යාච්ඥාව උන්වහන්සේ වෙතට ඔසවන්න. උන්වහන්සේ ඔබගේ යාච්ඥාවට පිළිතුරු දෙන සේක. එසේම ඔබගේ මුඛයේ වචනය ගැන ප්‍රවේශම්වන්න.

උන්වහන්සේ ඔබව හොඳින් හඳුනන නිසා ඔබගේ සැබෑ අවශ්‍යතාවය උන්වහන්සේට දැනෙන බව විශ්වාස කරන්න. සැකයෙන් තොරව ඔබගේ ස්තූතිය, ප්‍රශංසාව, ඔබගේ අවශ්‍යතාවය උන්වහන්සේ වෙතට ඔසවන්න. එලෙසම දේවවචනය දිනපතාම කියවීම තුළින් උන්වහන්සේව හඳුනාගන්න. යේසුස්වහන්සේගේ හඬවතට ළංවෙන්න. උන්වහන්සේට ඇහුම්කන්දෙන්න.

යේසු පිහිටයි.

**- ආදර ශෂිලා නැන්දා -**



# කන්ද උඩ දේශනාව



ස්වාමීවූ යේසුස්වහන්සේගේ ඉගැන්වීම් අතර කන්ද උඩ දේශනාව මහත් ප්‍රසිද්ධියක් උසුලන අතර එහි අන්තර්ගතය තුලින් ප්‍රබල කිතුණු ඉගැන්වීම ප්‍රදර්ශනය වේ. තම අනුග ාමිකයන් ජීවිත් විය යුතු ආකාරය මෙහි යේසුස්වහන්සේ පෙන්වා දෙයි. එනම් ප්‍රායෝගික කිතුණු ජීවිතය පිළිබඳ කරුණු කාරණා මෙහි අඩංගු වේ. කන්ද උඩ දේශනාවේ අඩංගු පද කිහිපයක් සලකා බලමු.

## 01 කිතුණු සාක්ෂිය සහිත ජීවිතය.

**"නුඹලා පොළොවේ ලුණුය. නමුත් ලුණුවල රස නැතිවුවහොත් ඒවා කුමකින් රස කරනු ලබන්නේද?" (මතෙව් 5:13).**

කිතුණුවකු ලෙස ඔබ, මා පොළොවේ ජීවත් වන විට එහි බලපෑමක් අන් අයට ඇති විය යුතුය. එනම් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රතිපත්ති අනුගමනය කරන බවට ඇති සාක්ෂියයි. ලුණු ස්වල්පයකින් කෑම රසවත් වන්නා සේ සුලුතරයක් වූ ඇදහිලිවන්තයන්ගෙන් සමාජයට යහපතක්, රසයක් ගෙන ඒමට නම් ලුණු වල ලුණු රසය ආරක්ෂා විය යුතු ආකාරයට කිතුණුවන්ගේ කිතුණු සාක්ෂිය ආරක්ෂා විය යුතුය **(රෝම 12:1,2).**

## 02 ක්‍රිස්තුස්වහන්සේගේ ගුණාංග ප්‍රදර්ශනය කරන ජීවිතය.

**"නුඹලා ලෝකයේ ආලෝකයය, කන්ද මුදුනෙහි තිබෙන නුවරක් සඟවන්නට නොහැකිය" (මතෙව් 5:14).**

මෙහිදී බයිබලීය ප්‍රතිපත්ති අනුමානය පුද්ගල ආලෝකයට සමාන කර ඇත. සැඟ විය නොහැකි ආලෝකයය. එනම් යේසුස්වහන්සේගේ ගුණාංග සහිතව කිතුණුවාගේ සමාජානුයෝජනය මෙහි අර්ථය ලෙස මා දකිමි. එනම් ක්‍රිස්තුස්වහන්සේ හැසිරුණාක්මෙන්

අපත් හැසිරීම මඟින් අන් අයට ආලෝකයක් විය හැක. උදාහරණයක් ලෙස වෛරයට වෛරය නොකිරීම වැනි ඉතා උතුම් ගුණාංග සහිත ජීවිතය.

## 03 දේව වචනය මත පදනම් වූ ජීවිතය

**"අහසත් පොළොවත් පහව යන තෙක් සියල්ල සිදුවන තුරු ව්‍යවස්ථාවෙන් එක අකුරක්වත් බින්දුවක්වත් කිසිසේත් පහව නොයන්නේය. ඒවා පවත්වන්නාවූ, උගන්වන්නාවූ කවරෙක් නමුත් ස්වර්ග රාජ්‍යයෙහි උතුම්ය" (මතෙව් 5:18,19).**

බයිබලය දෙවියන්වහන්සේගේ වචනය බවත්, කිතුණු ජීවිතයේ අත්පොත බවත්, අවසාන අධිකාරීත්වය බයිබලය බවත් විශ්වාස කරන ජීවිතයක් ගත කිරීම දෙවියන්වහන්සේගේ ආශාවයි. ජීවිතයේ සෑම තීරණයක්ම දේව වචනයේ මඟපෙන්වීම මත බයිබලීය ප්‍රතිපත්ති මත ගැනීම ඉතා වැදගත්ය **(2 තිමෝති 3:16).**

## 04 දේව අනුග්‍රහය මත පදනම් වූ ජීවිතය.

**"නුඹලාගේ ධර්මිෂ්ඨකම ලියන්නන්ගේ ද, පරිසිවරුන්ගේද ධර්මිශ්ඨකමට වඩා වැඩි නොවී නම් නුඹලා කිසිසේත් ස්වර්ගරාජ්‍යයට ඇතුල් නොවන්නහුය" (මතෙව් 5:20).**

ලියන්නෝ සහ ඵරිසිවරු එවක සිටි ආගමික නායකයෝය. ඔවුන් මනුෂ්‍යයන් ඉදිරියේ තම හොඳ ක්‍රියා වල යෙදී ඒමගින් මනුෂයන් ඉදිරියේ ධර්මිෂ්ඨ ලෙස පෙනීමට උත්සහ කළෝය. එහෙත් ඔවුන්ගේ හදවත බොහෝ දුෂ්ඨකම හා නපුරුව තිබුණු බව බයිබලය පවසයි. එහෙත් සැබෑ ධර්මිෂ්ඨකම පැමිණෙන්නේ ඇදහිල්ලෙන්ය. යේසුස්වහන්සේගේ මරණය, වැලලීම, නැවත නැගිටීම තමාට අදාල කර ගනිමින් විශ්වාස කිරීම මඟින් අප ධර්මිෂ්ඨ කොට ගණන් ගනු ලබයි. එය පව්කාරයා දෙවියන්වහන්සේගේ අනුග්‍රහය නිසා ධර්මිෂ්ඨකොට ගණන් ගනු ලැබීම ලෙස හඳුන්වයි. අප ජීවිතය ද එම දේව අනුග්‍රහය මත ගොඩ නොනැගිය යුතුය **(රෝම 5:1).**

## 05 කැඩුනාවූ බිඳුනාවූ හදවත් සහිත ජීවිතය.

**"නුඹේ පඬුරු පූජාසනය ළඟ පුදන කල්හී නුඹේ සහෝදරයා නුඹ කෙරෙහි යම් විරුද්ධත්වයක් ඇති බව එහිදී නුඹට සිහි වී නම් නුඹේ**

**පඬුර පූජාසන මත තබා ගොස් පළමුකොට නුඹේ සහෝදරයා හා සමඟි වී පසුව ඇවිත් නුඹේ පඬුර පුදාපන්න" (මතෙව් 5:23-24).**

තමන් දෙවියන්වහන්සේ සමඟ හා මනුෂ්‍යයන් සමඟ නිවැරදි සම්බන්ධතාවයක් පවත්වාගෙන යෑම හා තමාගේ වරද පිළිග න්නා ස්වභාවයක් තමා තුළම පවත්වා ගෙන යෑම එනම් තමන්ගේ වැරදි දෝෂ පිළිබඳ තමා තුලම පසුතැවිල්ලක් සහිත හදවතක් සහිත ජීවිතය **(ගීතාවලිය 51:17).**

## 06 ශුද්ධ ජීවිතය.

**"කාමමිත්‍යාචාරය නොකරවයි කී බව නුඹලා අසා තිබේ. නමුත් මම නුඹලාට කියමි, ස්ත්‍රියකු දෙස රාගයෙන් බලන කවරෙක් නමුත් එවලේම ඈ සමඟ සිතින් කාමමිත්‍යාචාරය කළේය" (මතෙව් 5:27-28).**

යේසුස්වහන්සේගේ මරණය හා ලේ වැගිරීම කරණකොට ගෙන අප සියල්ල ධර්මිෂ්ඨකොට ගණන් ගෙන තිබෙන අතර අපගේ පාප සියල්ල උන්වහන්සේගේ ලේ වලින් සෝදා හැර ඇත. සියලු ඇදහිලිවන්තයින් දැන් කැඳවන්නේ ශුද්ධ ජීවිතයක් ගත කිරීම උදෙසාය. ශුද්ධ වචනය හා ශුද්ධාත්මයාණන් මඟපෙන්වීම අනුව ශුද්ධව ජීවත්වීම අප සැමගේ ම වගකීමක් හා සේවය වේ. එමගින් දෙවියන්වහන්සේ ප්‍රසන්න වේ **(1 පේත්‍රුස් 1:16).**

## 07 බොරුවෙන් තොර සත්‍යවාදී ජීවිතය.

**"මම නුඹලාට කියමි. බොරුවට නොදිවුරව, කිසිසේත් නොදිවුරල්ලා, නුඹලාගේ වචනය එසේය, එසේය, කියාද නැත නැත කියාද වේවා" (මතෙව් 5:33-37).**

බොරුවේ පියා යක්ෂයාය. **(යොහාන් 8:44)** මුලු සමාජයම බොරු හා වංචාවෙන් පිරී පවතී. එහෙත් යේසුස්වහන්සේ අනුගමනය කරන්නන් බොරුකාර ජීවිතයෙන් ජයගෙන තමා සියලු මාර්ග වල දී අවංකව ක්‍රියා කල යුතු බව මෙයින් අපට පෙන්වා දෙයි. කොපමණ අලාභ වුවත් අවංක වීම දෙවියන්වහන්සේ අපෙන් බලාපොරොත්තු වෙයි **(එපීස 4:25).**

- සංස්කාරක -

**එස්. මෙත්තානන්ද**

**077 8813197**

# බර්තිමෙයුස් ඔබට කතා කරයි ...

ප්‍රේමවන්ත සොයුර, සොයුරිය යේසුස්වහන්සේගේ පොළොවේ සේවයේ කාලයේදී සිදුවුනු ඉතා සිත් ගන්නා සුලු සිදිවීම් අතුරින් තවත් එක් සුවිශේෂී සිදුවීමකට ඔබගේ අවදානය යොමු කිරීමටයි මගේ මේ සූදානම. ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුලින් සුවය ලද තවත් එක් පුද්ගලයෙකු ශුද්ධ වචනය තුල අපට මුණ ගැසේ. ඔහුගේ කතන්දරය සැබවින්ම තවමත් ජීවනදායක ස්වාමින්වහන්සේව පිළිනොගෙන ස්වාධී නව ජීවත් වන මිනිසාව පෙන්වනු ලබන කැඩපතක් බඳුය ඔහු අන් අයෙකු නොව සුභාරංචි පොත් තුනකම සඳහන් බර්තිමෙයුස් වේ. ඔහු පිළිබඳ **(ශු. මතෙව් 20:29-34, මාර්ක් 10:46-52, ලූක් 18:35 බලන්න).**

ඔහු අන්ධයෙකු වන අතර කිසිවෙක්ම නොමැති අසරණ සිඟන්නෙකි. මෙය කියවන අපට පෙනෙන්නේ ඔහුගේ ජීවිතයේ ඉතා වටිනා දෙයක් ඔහුට අහිමිව ගොස් තිබූ බවය. ඒ අන් කිසිවක් නොව දෑස් පෙනීමය. අප දන්නා පරිදි මිනිසෙකු හට කුමන දේ තිබුනද සිය දෑස් නොපෙනේනම් කවර දෙයක් තිබුනද ඉන් පලක් නොමැත. ඔහු සිඟන්නෙකු වූයේ කෙලෙසද යන්න අප නොදත් නමුත් ඔහු අසරණ අන්දයෙකු සහ සිඟන්නෙකු පමණක් බව දේව වචනය පවසයි. ඔහු අපට කියන පණිවිඩය කුමක්ද? වර්තමානයේ බර්තිමෙයුස් වැන්නන් අප අතර කොතෙකුත් ගැවසෙයි. ආත්මිකව අන්ධව තම ජීවිතය තුල වටිනා කියන කිසිවක් නොමැතිව තමාට රිසි මාවත් තුල හිඳ සිටින මනුෂ්‍යා අපට සිහි ගන්වනු ලබන්නේ එදා දේව වචනය තුල අපට හමුවන මෙම බර්තිමෙයුස්වය. ඔහුගේ අධ්‍යාපන මට්ටම කොතෙක්ද කියා අප නොදන්න නමුත් ඔහු විසින් ඉතා බුද්ධිමත් එමෙන්ම කාලෝචිත දෙයක් කල බව අපට පෙනේ.



එදා යෙරිකෝවට පැමිණ සිය ශ්‍රාවකයින් සමඟ යලි පිටත්ව යෑමට සැරසුණු අප ස්වාමින්වහන්සේට දාවිත්ගේ පුතු වූ යේසුස්වහන්ස, මට කරුණාකල මැනවයි මොර ගසන්නට පටන් ගත්තේය. **(මාර්ක් 10:47).**

සැබවින්ම මෙය වනාහි ඔහුගේ ජීවිතය තුල ඔහු විසින් ගත් වැදගත් මෙන්ම බුද්ධිමත් තීරණයක් බව ඔබ දන්නවාද? ඕනෑම මිනිසෙකු තම ජීවිත කාලය තුලදී ගත යුතු වටිනාම තීරණය කුමක්ද? "යන්න ඔහු අපට පෙන්වා දෙනු ලබයි. එදා ඔහු එසේ ස්වාමින්වහන්සේට මොර නොගැසුවා නම් අනිවාර්යෙන්ම ඔහුට මොර ගසන්නට සිදුවන්නේ සදාකාල ගිනි විලේදී බව නම් සත්‍යකි. සැබවින්ම මෙය වනාහි ඔහුගේ ජීවිතය

තුල ඔහු විසින් ගත් ඉතා වැදගත් මෙන්ම බුද්ධිමත් තීරණයක් බව ඔබ දන්නවාද? ඕනෑම මිනිසෙකු තම ජීවිත කාලය තුලදී ගත යුතු වටිනාම තීරණය කුමක්ද?" යන්න ඔහු අපට පෙන්වා දෙනු ලබයි. බර්තිමෙයුස් කෙරෙහි පමණක් නොව උන්වහන්සේට තවමත් හඬ නොගැසූ ජීවත්ව සිටින සියලු දෙනා කෙරෙහි බලපානු ලබන මහත් බියකරු සත්‍යද එයම වේ. එසේ හෙයින් යමෙකු තවමත් උන්වහන්සේගේ නාමයට හඬ ගසා නොමැතිද ඔහු මෙන්ම අපද සිටින්නේ ඉතා බියකරු වාතාවරණයක බව ඔවුන් විසින් දැනගත යුතුම වේ.

මිනිසුන් ලෙස බොහෝ දෙනා ක්‍රියාකාරකම් වල ඉතා ඕනෑකමින් නියැලෙති. සැබවින්ම ඒවා හුදෙක් මෙලෝ දිවියේ යසස කේන්ද්‍ර කොට ගෙන කරන ලද නිෂ්ඵල ක්‍රියාකාරකම් වෙති. එක්තරා රටක මිනිසෙකු විසින් එවැනි ක්‍රියාකාරකම් කළේය. එය දෙනෝදාහක් බලා සිටියදී විශාල අහස් යානාවක ගැට ගැසූ කඹයක් තම ශක්තිමත් බඳ වට බැඳ එම අහස් යානාව අඩි කිහිපයක් ඇද පෙන්වූයේ බලාසිටින්නන් මවිතයට පත් කරවමිනි. බලා සිටින්නන්ගේ හඬ ලැබී ඔහුට උත්තේජනය සපයන්නට ඇත. ඔහු ඉන් නොනැවතී එම පිරිස ඉදිරියෙන්ම විශාල දුම්රිය ඇන්ජිමකද සෙනඟ පිරවූ බස් රථයක්ද ඇද පෙන්වූයේ ප්‍රේක්ෂකයන්ගේ ජනාදරය දිනාගනිමින්ය. පසුව පුවත් පත් වේදීන් ඔහුගෙන් ඇසූ ප්‍රශ්නය වූයේ එසේ කිරීම තුලින් ඔහු බලාපොරොත්තු වන්නේ කුමක්ද? යන්නයි. ඊට ඔහු දුන් පිළිතුර වන්නේ තමාගේ නම ගිනස් පොතේ සටහන් කර ගැනීම තුලින් ලොව දිනූ අයෙකු වීම ඉන් අපේක්ෂා කරන බවයි. ගිනස් පොතේ නම සඳහන් වීම කෙසේ වුවද හිටිගමන් ඔහු මිය ගියේ පුදුම සහගත ලෙසටය. වෛද්‍ය නිගමනය වූයේ හෙතෙම තම ක්‍රියාවේදී දරන්නාවූ ආයාසයකින් ශක්තිය නිසාම හෘද ස්නායුන් දැඩි තෙරපීම නිසා පුපුරා ගොස් ඇති නිසා එසේ වූ බවයි. සැබවින්ම මිනිසෙකු හට එකම එක වතාවක් පමණක් ලැබෙන මෙම දිවියේදී සිතට ගත යුතු වන්නේ කෙදිනක හෝ ක්ෂයවී යන මිනිසුන් විසින් සාදන ලද ගිනස් පොතක තම නම ඇතුලත් කර ගැනීම නොව සදාකාලික ජීවන පොතේ තම නම ලියවා ගැනීමය.

මන්දයත් කෙනෙකුගේ නාමය එම ජීවන පොතේ ලියා නොමැති බව සම්බවීමේදී එබඳු අයට අත් වෙන ඉතා බිය ගෙන දෙන බේදජනක ඉරණම පිළිබඳව **එළිදරව් 20:15/21:27 සහ නික්මයාම 32:33** සහ **දානියෙල් 12:1-2 පද** ඔබගේම ශුද්ධ බයිබලය පෙරලා කියවන්න. තත්වය එසේ තිබියදී අපට බර්තිමෙයුස් දෙන පණිවිඩය නම් කොතෙක් නම් වටීද? යන්න දහස් වරක් සිතා බැලීම වටියි.

තවද මෙම මිනිසා උන්වහන් සේගේ උතුම් නාමය කියා මොර ගැසීමට රිසි නොවූ අන්‍යන්ගෙන් තවත් එසේ නොකරන ලෙසට කල සරදම ගනන් නොගෙනත් ඔහු වඩ වඩාත්ම මොර ගසන්නට විය. ඔහුගේ හඬ එදා රැව් පිලි රැව් දෙන්නට ඇත. ඔබ කෙදිනක හෝ සත්‍යය වැලඳ ගත් විට ඊට විරුද්ධව යක්ෂයා සිය තාවකාලික ආදිපත්‍යය පතුරුවා ඔබ ලබාගත් උතුම් ගැලවීම ඔබට අහෝසි කිරීමට උත්සහ කරනු ඇත. එහෙත් මුළු සිත උන්වහන්සේ වෙත තැබූ අයෙකුට තම ඇදහිල්ල පවත්වා ගැනීමට ඒ කිසිවක් බාධාවක් නොවනු ඇත. ප්‍රේමවන්ත සොයුර සොයුරිය, මෙම පද කිහිපය තුල ඉතා වැදගත් දේ සිදුවන්නේ දැන්ය. **(මාර්ක් 10:49 බලන්න) "යේසුස්වහන්සේ නැවතී**

**සිට; ඔහුට අඬගසන්නැයි කීසේක. ඔව්හු අන්ධයාට අඬගසා; ධෛර්යවන්ත වෙයන්න, නැගිටින්න, උන්වහන්සේ නුඹට අඬගසන සේකැයි කීවෝය".** සැබවින්ම මින් අපගේ වගකීම සිහිග න්වනු ලබයි අප කොතෙක් අපගේ කිතුණු ජීවිතයේදී අන් අයව යේසුස්වහන්සේ වෙතට අඬ ගසා තිබේද යන්න අප අපෙන්ම විමසා බැලීම ඉතා වටියි. එතුමානන් වෙතට ලෝකේ විනාශය කරා වේගයෙන් ඇදෙන අයවලුන් කැඳවා ගැනීමට සිටින අය අපම බව අපටම අමතකව ගොසිනි. ප්‍රිය මිතුර, මිතුරිය කාලය අපට තව කොතෙක් ඉතිරිව තිබේද යන්න අප නොදන්නා බැවින් විනාශයට ඇදෙන මිනිසාව ඉන් ගලවා උන්වහන්සේට බාර දීම ඉතා වේගයෙන් සිදු වන්නට ඕනෑව තිබේ. එයද යුගයේ අවශ්‍යතාවයයි. **(මාර්ක් 10:49 බලන්න) "යේසුස්වහන්සේ නැවතී සිටඃ ඔහුට අඬගසන්නැයි කීසේක. ඔව්හූ අන්ධයාට අඬගසාඃ ධෛර්යවත් වෙන්න, නැගිටින්න, උන්වහන්සේ නුඹට අඬගසනසේකැයි කීවෝය".** සැබවින්ම මින් අපගේ වගකීම සිහිගන්වනු ලබයි. අප කොතෙක් අපගේ කිතුණු ජීවිතයේදී අන් අයව යේසුස්වහන්සේ වෙතට අඬගසා තිබේද යන්න අප අපෙන්ම විමසා බැලීම ඉතා වටියි. එතුමානන් වෙතට ලෝකේ විනාශය කරා වේගයෙන් ඇදෙන අයවලුන්ව කැදවා ගැනීමට සිටින අය අපම බව අපටම අමතක වී ගොසිනි. ප්‍රිය මිතුර, මිතුරිය කාලය අපට තව කොතෙක් ඉතිරිව තිබේද යන්න අප නොදන්නා බැවින් විනාශයට ඇදෙන මිනිසාව ඉන් ගලවා උන්වහන්සේට බාරදීම ඉතා වේගයෙන් සිදුවන්නට ඕනෑව තිබේ. එයද යුගයේ අවශ්‍යතාවයයි. පිළිගත් මෙම මිනිසාගේ ක්ෂණික වෙනස් වීම් කෙතරම් සිත් ගන්නා සුලුද? ඔහු තමාගේ සළුව ඉවත දමා ජීවන දායක යේසුස්වහන්සේ වෙතට ගිය බව දේව වචනය පවසයි. සෑම මිනිසෙකු සතු පාපය හා අධර්මිෂ්ඨ ජීවිතය නැමති සළුව ජීවනදායක යේසුස්වහන්සේ ඉදිරියේ ඉවත් කර ජයගත් කෙනෙකු විය **(යෙසායා 61:10 / මාර්ක් 5:15).**


කෙනෙකු සිය ජීවිතයේ භෞතික වස්තූන් ලබා තිබුනද තමාගේ ජීවිතය යේසුස්වහන්සේ තුල නියම පරිවර්තනයක් සිදු වී නොමැති නම් එයමද තමා විසින් තමාටම කර ගන්න විශාල හානියක් බව බොහෝ දෙන නොදනී **(ශු. මාර්ක් 5:5 බලන්න)** මොහුගේ ඕනෑකම වූයේ සිය දෑස් පෙනීම ලබා ගැනීම බව **ශු. මාර්ක් 10:51 දැක්වේ.**

ලොව පටන් ගැනීමේදී යක්ෂයා විසින් අන්ධ කල ඇස් යලි පෙනීම ගෙන දිය හැකි එකම දිව්‍ය වෛද්‍යවරයාණෝ අප ස්වාමීන්වහන්සේව පමණක් වේ. මිනිසාව තමාගේම සිර ගෙවල් තුල සිර කර යක්ෂයා ඔවුන්ගේ ජීවිත කෙරෙහි ජයනාද පතුරුවති. එහෙත් බර්තිමෙයුස් නම් මිනිසා අපට ආදර්ශයක් දෙමින් ඊට ප්‍රතිගාමීව ක්‍රියා කොට සත්‍යය දුටුවා සේම ඔබත් සත්‍යය දකින්නෙකු වන්න. ඔබ තවත් යේසුස් ස්වාමීන්වහන්සේට හඬ ගසා නොමැතිනම් එහි තේරුම ද ඔබ තවමත් ආත්මිකව අන්ධ බවයි. ප්‍රමාද වීම බිහිසුනු ප්‍රතිඵල ගෙන දෙනවාසේම කඩිනමින් යේසුස්වහන්සේව පිළිගැනීම හා අදහාගැනීම ඔබව සදාකාල ජීවනයේ කොටස් කරුවෙකු කෙරෙනු ඇත.

**"ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහාගන්න. එවිට නුඹ ගැලවෙන්නෙහිය" (ක්‍රියා 16:31).**

**- මැතිව් ප්‍රියංකර ෆොන්සේකා -**

# පිටසක්වල ජීවීන් පිළිබඳ ඇති විශ්වාසය



20 වන ශත වර්ෂයේ මැද භාගයේ පමණ සිට පිටසක්වල ජීවීන් පිළිබඳ විශ්වාසයක් ලෝකය පුරා ප්‍රචලිත වන්නට විය. අප ජීවත් වන විශ්වයේ සූර්යයෝ අසංඛ්‍ය ගණනක් වෙති. එම එක එක සූර්යයා අවට භ්‍රමණය වන ග්‍රහලෝක ගණන කියා නිම කල නොහැකි තරම් අති විශාලය. අපගේ සෞරග්‍රහ මණ්ඩලයේ බුධ, සිකුරු, සෙනසුරු වැනි ග්‍රහලෝක පිහිටා තිබෙන නමුදු ජීවීන් සිටින්නේ පෘතුවිය මතුපිට පමණි. එහෙත් විශ්වයේ කොතැනක හෝ තවත් ග්‍රහලෝකයක ජීවීන් සිටිනු ඇතැයි මතවාදයක්ද, විශ්වාසයක්ද ගොඩනැගී තිබේ. එකදු භෞතිකමය සාක්ෂියක් නොමැති නමුදු පිටසක්වල ජීවීන් සහ ඔවුන්ගේ ගගන යානා (පියාඹන පිරිසි) පිළිබඳ කතා බොහෝය.

පිටසක්වල ජීවීන් මෙලොව ආක්‍රමණය කරණු ඇතැයි යන විශ්වාසය දැන් කුඩා දරුවකු තුළ පවා නිධන් ගතවී තිබේ. කුඩා ළමුන් නරඹන කාටූන් රූපවාහිනී දර්ශන බොහෝමයක් පිටසක්වල ජීවීන් ඇතැයි යන මතවාදය ඉස්මතු කර පෙන්වයි. මෙම තත්වය යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීමට ලෝක පරිසරය සහ වාතාවරණය සූදානම් කිරීමක් වැනිය. මන්ද ස්වාමී වූ යේසුස්වහන්සේ වළාකුලු මතට පැමිණ සභාව ඔසවා ගත් විට එය පිටසක්වල ජීවීන්ගේ ආක්‍රමණයක් ලෙස ද අතුරුදහන් වූවත් එම පිටසක්වල ජීවීන් විසින් ඩැහැගෙන යන්නට ඇතැයිද පිළිග නු ලබනු ඇත. **"මේ නිසා සැබෑව විශ්වාස නොකොට අධර්මිෂ්ඨකමට ප්‍රසන්න වූ සියල්ලන්ම විනිශ්චය කරනු ලබන පිණිස බොරුව විශ්වාස කරන හැටියට දෙවියන්වහන්සේ මුලාවේ ක්‍රියාකිරීමක් ඔවුන්ට එවන සේක" (2 තෙසලෝනික 2:11,12).** මෙම සිදුවීම සඳහා වර්තමාන ලෝකය සූදානම් කරනු වස් පිටසක්වල ජීවීන් පිළිබඳ විශ්වාසය ලොව මුලුල්ලේ ප්‍රචලිත වී තිබේ.

## පිටසක්වල වෙසෙන ජීවීන්

පිටසක්වල ජීවීන් සිටිත්ද? එසේනම් ඔවුන් සිටින්නේ කුමන ග්‍රහලෝකයේද? බයිබලය කියවා, අධ්‍යනය කොට විශ්වාස කරන අය මෙම පැණයන්ට පිළිතුරු සොයාගෙන

තිබේ. පිටසක්වල බොහෝ ජීවීන් සිටින බව ශුද්ධ බයිබලය ප්‍රකාශ කරයි. එහෙත් ඒ ජීවීන්, ඔබ මා සිතන ආකාරයේ ජීවීන් නොවේ. ඔවුන් නම් දෙවියන්වහන්සේගේ දූත සේනාව හා යක්ෂයාගේ දූත සේනාවන්ය. ස්වර්ගයේ සිට දේව දූත සේනාවෙන් තුනෙන් එකක් පමණ ලුසිෆර් නම් වූ සාතන් සමඟ පහත හෙලනු ලැබූ බව තේරුම් ගැනීමට තරම් සාධක ශුද්ධ බයිබලයේ තිබේ. දේවියන්වහන්සේගේ දූත සේනාවත් සාතන්ගේ දූත සේනාවත් හැරුණු කොට වෙනත් ජීවීන් මේ මුලු සක්වලේ ජීවත් වන්නේ නැත. දෙවියන්වහන්සේගේ දූතයන් පිටසක්වල ජීවීන් ලෙස පොළවේ දර්ශනය වූ කැපී පෙනෙන එක අවස්ථාවක් තමා **එසකියෙල් 1 වන පරිච්ඡේදය.** කරුණාකර එම දේව වචන කොටස කියවන්න. භයංකාර හා දීප්තිමත් විශාල චක්‍ර හා වේගයෙන් ගමන් කරන ආලෝක කදම්භ ගැන එහි විස්තර වේ. එය දෙවියන්වහන්සේගේ තේජෝමහිමය පිළිබඳ විස්තරයකි. එහි දර්ශනය වනුයේ කෙරුබ්වරු නැමැති දූත විශේෂයයි. වර්තමානයේ මිනිසුන් දැක තිබේ යැයි කියන පියාඹන පිරිසි වල විස්තරයට තරමක් සමාන වූ විස්තරයක් **එසකියෙල් 1 වන පරිච්ඡේදයේ** තිබේ.

දෙවියන්වහන්සේගේ දූත සේනාවන් සිටින්නේ ස්වර්ගයෙහිය. දෙවියන්වහන්සේගේ අණ පිට ඔවුන් පොළවට පැමිණි ඇතැම් අවස්ථාවන් ගැන බයිබලයේ සඳහන්ව තිබේ. එවන් බොහෝ අවස්ථාවන් අතුරින් උදාහරණ දෙකක් වශයෙන් ආබ්‍රහම් හමුවීමට පැමිණි ස්වර්ගික අමුත්තන් **(උත්පත්ති 18)** සහ යේසුස්වහන්සේගේ උත්පත්තිය ගැන ප්‍රකාශ කිරීමට මරියා වෙත පැමිණි ගාබ්‍රියෙල් දේව දූතයා **(ලූක් 1:26-38)** සැලකිය හැකිය.

යක්ෂයාගේ වර්තමාන වාසභවන ආකාශයයි. මේ නිසා ඔහුට **"ආකාශයේ බලයේ අධිපතියා"** යන නම ආරූඪ කර ඇත **(එෆීස 2:2). "ස්වර්ගික ස්ථාන වල සිටින දුෂ්ඨකමේ ආත්ම සේනාව" (එෆීස 6:12)** ලෙසද යක්ෂයාගේ දූතයන් හඳුන්වා තිබේ. ඇතැම් අවස්ථාවකදී පොළොව මතුපිට දී යක්ෂ දූතයන් දර්ශනය වීම අදත් සිදුවිය හැකිය. එහෙත් එය සුළභව දක්නට නොලැබේ. යක්ෂයා සෑම විටම කරන්නාක් මෙන් තමාගේ නියම ස්වරූපය නොපෙන්වා පිටසක්වල ජීවීන් සිටිතැයි මිත්‍යා විශ්වාසයක් ගොඩනගා තිබේ. අවසාන කාලයේ මුලා කිරීම් සිදු කරන්නට දෙවියන්වහන්සේ යක්ෂයාට ඉඩ දෙන බැවින් ඔහු තම බොරු වලින් ලෝකයා මුලා කල ඇතැම් අවස්ථා වාර්තා වී තිබේ. පිටසක්වල ජීවීන් හැම විටම භයංකර පිළිකුල් සහගත පෙනුමක් ඇති අය ලෙස සඳහන් කර තිබේ. ඇතැම් වාර්තාවල දෙවියන්වහන්සේටත් ශුද්ධ බයිබලයටත් එරෙහිව කළ ප්‍රකාශයන්ද, පරිණාමවාදයට සහයෝගය දක්වන ප්‍රකාශයන්ද සඳහන්ව තිබේ. මිහිපිට මිනිසා ජනිත කරවනු ලැබුවේ දෙවියන්වහන්සේ නොව පිටසක්වල ජීවීන්ගේ ක්‍රියාකාර

කමකින් යැයි ඇතැම් වාර්තා සඳහන් කරයි. එම නිසා මෙයට යක්ෂයාගේ ඇති සම්බන්ධකම අපට හඳුනා ගත හැක.

අවසාන කාල වකවානුව ගැන යේසුස්වහන්සේ ප්‍රකාශකල අනාවැකි කිහිපයක් **ලූක් 21:10 සහ 11** පදවල සඳහන් වේ. **"ජාතියක් ජාතියකටද රාජ්‍යයක් රාජ්‍යයකටද විරුද්ධව නැගිටිනවා ඇත. මහත් භූමිකම්පාද නොයෙක් තැන්වල සාගත හා වසංගතද වන්නේය. භයංකර පෙනීම්ද, අහසින් මහත් ලකුණුද වන්නේය".**

## සත්‍ය සිද්ධීන්

**"සෝෂලිස්ට් ඉන්ඩස්ට්‍රි"** නම් වූ රුසියානු පුවත් පතෙහි 1989 සැප්තැම්බර් 30 වැනිදා එක්තරා වාර්ථාවක් පළවිය. එය මෙසේයි, 1989 මාර්තු 21 දා රාත්‍රියේ බයිලෝ රුසියා හි බොරිසෝස් නගරයට ඉහල අහසේ සෝවියට් ජෙට් යානා දෙකක් පුහුණු වීමක නිරත විය. ඉන් එකක නියමුවන් තමාට නුදුරින් හදිසියේම පෙනෙන්නට පටන් ගත් අමුතු මාදිලියේ අහස් යානාවක් පිළිබඳ සෝවියට් පාලක මැදිරියට දැනුම් දුනි. එය අධික වේගයෙන් කැරකෙන පැතලි ස්වරූපයක් ගත් යානයක් වූ අතර ආලෝක කදම්භ තුනක් පහළටත් දෙකක් ඉහළටත් යන වශයෙන් දිස්වන බව දන්වා සිටියහ. එම යානය දෙසට ගමන් කිරීමට පාලක මැදිරියෙන් අණ ලැබීමෙන් අනතුරුව එදෙසට ගමන් කරත්ම එක ආලෝක කදම්භයක් තම ජෙට් යානයේ ගගන කුටිය වෙතට යොමු වූ බව ඔවුහු දන්වා සිටියහ. ඉන් තමා සිටි ස්ථානය ආලෝකමත් වූ අතර ඔවුන්ගේ ශරීරවලට රස්නය දැනුනි. සුලු මොහොතකින් එම නාඳුනන යානය නොහොත් පියාඹන පිරිසිය දුරට ඇදී ගොස් නොපෙනී ගියේය. ජෙට් යානය පැදවූ අණ දෙන නිළධාරියා මාස කිහිපයක් ඇතුළත මරණයට පත් විය. ඔහුගේ මරණ සහතිකයේ මරණයට හේතුව වශයෙන් සඳහන් වූයේ නාඳුනන පියාඹන යානයකින් නිකුත් වූ විකිරණශීලීතාවය හේතු කොට ගෙන හටගත් පිළිකාවක් බවයි. ඔවුන්ගේ සහයක නියමුවා ද රෝගාතුර වූ අතර නිතර නිතර සිහි මුර්ච්ජා වීම් වලට භාජනය විය.

1999 ජූලි 16 වැනිදා ප්‍රංශයේ ජාතික ආරක්ෂාව පිළිබඳ උසස් අධ්‍යාපන ආයතනය මගින් වැදගත් ලියවිල්ලක් ප්‍රකාශයට පත් කර ප්‍රංශ ජනාධිපති ජැකස් චිරාක් මහතාට පිළිගන්වනු ලැබීය. එහි සඳහන් වූයේ ලෝකය පුරා වාර්තා වී ඇති නාඳුනන පියාඹන යන්ත්‍ර හෝ යානා පිළිබඳ පූර්ණ විග්‍රහයකි. එපමණක් නොව ලෝකයේ සෑම දියුණු රටකම නාඳුනන පියාඹන යන්ත්‍ර දර්ශනය වීම සොයා බැලීමට විශේෂඥයන් පත්කර, ආයතනද පිහිටුවා තිබේ.

ඉහත සාධක බැලූ විට පෙනී යන්නේ පිටසක්වල ජීවීන් පිළිබඳ ප්‍රකාශණ සෑම විටම සිතින් මවා ගත් ඒවා හෝ වෙනත් සාධාරණ පැහැදිලි කිරීමක් ඇති සිද්ධීන් නොවන බවයි.

**ඉතිරි කොටස - පිටු අංක 15**

# ක්‍රිස්තුස්වහන්සේ තමන්ම සතුටු කර නොගත් සේක.

## (රෝම 15:3)

ස්වාමීවූ යේසුස්වහන්සේ මෙලොව ජීවත් වූ කාලය පිළිබඳව ශුභාරංචි පොත් සතරෙහි සහ යැවුම් පත්‍ර වල මනා විස්තරයක් කර තිබේ. **2 කොරින්ති 5:22 - " පාපයක් නොදත්තාවූ උන්වහන්සේ අප වෙනුවට පාපය වෙන්නට දෙවියන්වහන්සේ සැලැස්වූ සේක".** පාපයක් නොදත්තාවූ තැනැන්වහන්සේ පාපය බවට පත්වීම සුලුපටු කරුණක් යැයි ඔබ සිතන්නේද? ක්‍රිස්තුස්වහන්සේ තමන්ම සතුටු කර ගනිමින් සිටි සේක් නම් එවැනි දෙයකට කිසි දිනෙක ඉඩ නොදෙනු ඇත. අප කිසිවෙකු අසුචි පිරි ජරා වලකට එක මොහොතකට හෝ බසින්නට කැමති වන්නේ නැත. යේසුස්වහන්සේගේ පාරිශුද්ධත්වය සමඟ සසඳන විට මේ ලෝකයට පැමිණීමට කැමති වූ සේක. එසේ පැමිණි විට උන්වහන්සේ හාත්පස වටකර සිටියේ පව්කරුවන්ය. ඔවුන් සැමගේ පාපකාරී සිත උන්වහන්සේ ඉදිරිපිට ප්‍රදර්ශණය වෙමින් තිබුණි. එහි සිටි එකම ශුද්ධ තැනැන්වහන්සේ යේසුස්වහන්සේ පමණකි. එතකින් නොනැවතුණු උන්වහන්සේ තමන් අවට සිටි ඒ සියලු පව්කරුවන්ගේ ද එදා මෙදා තුර ලෝකයේ ජීවත් වූ සියලු මිනිසුන්ගේද පාප කන්දරාව තම සිරුරමත දරාගන්නට කැමති වූ සේක. කුරුසියේ ඇණ ගසා සිටි විට දෙව්පියාණන්වහන්සේට උන්වහන්සේ පෙණුනේ එකම පාප ගුලියක් ලෙස විය හැකිය. **"කිසි පාපයක් නොදත්තාවූ තැනැන්වහන්සේ පාපය වෙන්ට"** කැමති වූ සේක. අනුන්ගේ පාපවල වන්දිය තමන් පිට ගැනීම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කල අනර්ඝතම කර්තව්‍යයි. උන්වහන්සේ තමන්ම සතුටු කර ගත්තේ නම් අපේ පව්වලට වන්දි ගෙවීමේ වැඩය පසෙක දමා යලි ස්වර්ග යට හැරී යාමට උන්වහන්සේට හොඳටම ඉඩකඩ තිබිණි. එහෙත් එසේ නොකොට පව්කරුවන් වෙනුවෙන් තම ජීවිතය වගුරුවන්නට උන්වහන්සේ කැමති වූ සේක. අපගේ ආකල්පයත් ක්‍රියා කිරීමත් මේ ආදර්ශයට වඩා කොපමණ වෙනස්ද? අප නම් සැමවිටම කරන්නේ අපවම සතුටු කර ගැනීමයි. තවද අපම සුදනුන් කර ගැනීමට උත්සහ කිරීම අපගේ පොදු ලක්ෂණයකි. අනුන්ගේ වැරදි වෙනුවෙන් දුක් විඳීමට අපි නම් කොහොමටත් කැමති නොවෙමු. මේ තත්වය නිසා යේසුස්වහන්සේගේ චරිතාලංකාරය අප තුලින් ප්‍රදර්ශණය

නොවී තිබේ.

**මතෙව් 12:24 - "නමුත් පරිසිවරු ඒ අසා මොහු යක්ෂාධිපතිවූ බෙල්සෙබුබ් කරණකොටගෙන මිස වෙන හැටියකින් යක්ෂයන් දුරු නොකරන්නේ යයි කීසේක".** එවන් කුරිරු වචන ඇසීම යේසුස්වහන්සේගේ සිත කොපමණ මහත් සන්තාපයකට පත්කරන්නට ඇද්ද? එහෙත් උන්වහන්සේ තම සේවය අත් හැරියේ නැත. දිගටම කලේ එවන් කුරිරු මිනිසුන් හට යහපත කිරීමය. "නුඹට යක්ෂයකු වැහිලා" යයි යමෙක් ඔබට කිවහොත් ඔබ විසින් මොන විදියේ ප්‍රතිචාරයක් ඒ අයට දෙනු ඇද්ද? අප විසින් අපවම සතුටු කර ගැනීමේ කැමැත්ත නිසා අපට දොස් පවරන අය සමඟ ඇසුරු කිරීමටත් අප අදි මදි කරන්නෙමු. මෙය අප චරිතයේ පෙනෙන විශාල අඩුපාඩුවකි. යේසුස්වහන්සේගේ චරිත දීප්තිය අපගෙන් පරාවර්ථනය නොවන්නේ මේ නිසායි.

**මාර්ක් 3:21 - "උන්වහන්සේගේ නෑයෝ ඒ අසා උන්වහන්සේට ඔල්මාදයයි කියා උන්වහන්සේ අල්ලන්ට ගියෝය".** එවැනි පහත් විවරණයක් ගැන උන්වහන්සේ උරණ වූයේ නැත. පසුකලෙක උන්වහන්සේගේ සහෝදරයෝ යේසුස්වහන්සේ අදහා ගැලවීම ලබා බලවත් දේව දාසයින් බවට පත්වූහ. "නුඹට ඔල්මාද" හෝ "නුඹට පිස්සු" යයි යමෙක් ඔබට සරදම් කරන්නේ නම් ඔබගේ ප්‍රතිචාරය කුමක් වෙයිද? එසේ නොමැතිව එවැනි අයට දිගින් දිගටම යහපත කිරීමට ඔබ සූදානම්ද? එසේ නොමැතිව එවැනි අය "අතේ දුරින්" පමණක් තබා ගන්නට ඔබ කැමති වන්නේද? එසේ නම් ඔබ ඔබවම සතුටු කර ගන්නෙකි.

**මතෙව් 11:19 - "මනුෂ්‍යය පුත්‍රයා කමින් බොමින් ආවේය. බලව, කෑදර මනුෂ්‍යයෙක්ය, මුද්‍රික පානය බොන්නෙක්ය, සුංගම් අයකරන්නන්ගේත් පව්කාරයන්ගේත් මිත්‍රයෙක් යැයි ඔව්හු කියති".** "කෑදරයා" "බේබද්දා" වැනි දුෂ්ඨ චෝදනා යේසුස්වහන්සේට එල්ල කෙරුණි. අපට එවන් චෝදනා එල්ල වූයේ නම් එවැනි දෑ කී මිනිසුන්ගේ මුහුණ බලන්නටවත් අප කැමති වන්නේ නැත. එහෙත් ස්වාමීවූ යේසුස්වහන්සේ කලේ කුමක්ද? දිගින් දිගටම ඔවුන් අතරේ සේවය කිරීමයි. අවසානයේදී උන්වහන්සේ අල්ලා කුරුසියේ ඇණ ගසා මරා දමන තුරුම උන්වහන්සේ යහපත කිරීම අත හැරියේ නැත. යේසුස්වහන්සේගේ චරිතයේ දීප්තිමත් බව එයාකාරයි.



**යොහාන් 7:53, 8:1 - "එවිට සියල්ලෝ තම තමුන්ගේ ගෙවලට ගියෝය. යේසුස්වහන්සේ**

**ඔලීව කන්දට ගිය සේක".** මෙය කොතරම් කණගාටු දායක දර්ශණයක්ද? උදේ සිට සවස් වනතුරු දේවමාළිගාවේ සිට වචනය ඉගැන්වූ යේසුස්වහන්සේට රාත්‍රිය ගත කිරීමට තැනක් තිබුණේ නැත. වචනය ලබාගත් අය සවස් වන විට සතුටින් තම තමුන්ගේ ගෙවලට හැරී ගියෝය. යේසුස්වහන්සේට තිබුණේ ඔලීව කන්දයි. ගෙදරකට ආරාධනා කරණු ලැබූ අවස්ථා කිහිපයක හැර බොහෝ දිනවල උන්වහන්සේ ඔලීව කන්දේ ගහක් යට රාත්‍රිය ගත කරන්නට ඇත. අපි ලබා ගන්නවා මිස දෙන්නට නොකැමති මිනිසුන් වී සිටිමු. යේසුස්වහන්සේ ගෙදරට කැඳවාගෙන ගියොත් "කරදරයක්" යැයි ඇතමෙකු කල්පනා කරන්නට ඇත. වර්ථමාන කාලයේ ඇතැම් දේශකයෝ දේශනාවලින් අනතුරුව වායු සමීකරණය කල කාමරයක් රාත්‍රිය ගත කිරීමට සොයති. හරිහැටි සැලකුවේ නැති නම් යලි එවැනි තැනකට ගොස් වචනය දේශනා කිරීමට ඔව්හු අකමැති වෙති. එහෙත් යේසුස්වහන්සේ කළේ කුමක්ද? " **උන්වහන්සේ අලුයම දේවමාලිගා වට නැවත ආසේක. මුලු සෙනඟ උන්වහන්සේ වෙතට පැමිණියෝය. උන්වහන්සේ වැඩහිඳ ඔවුන්ට ඉගැන්වූ සේක".** යයි **යොහාන් 8:2** හි ලියැවී ඇත. ඉහත බයිබල් පදය "උන්වහන්සේ වැඩහිඳ ඔවුන්ට හොඳටම දොස් තැබූ සේක" යයි ලියැවුනා නම් සාධාරණයි. එහෙත් යේසුස්වහන්සේ තමන්ම සතුටු කර නොගත් හෙයින් තමන්ට කල නොසැලකිල්ල නොසලකා හැර දිගින් දිගටම වචනය ඉගැන්වීමෙහි යෙදී සිටි සේක. **"අලුයම නුවරට නැවත යන අතර උන්වහන්සේට බඩගිනි විය"** යයි **මතෙව් 21:18** ලියැවී තිබේ. අලුයම බඩගිනි වීමේ හේතුව රාත්‍රියේ නිරාහාරව සිටීම විය හැක. එය සුලුපටු බඩගින්නක් නොවේ. කිසිවෙකු උන්වහන්සේට කෑම නොදුන් නිසා පාර අද්දර තිබූ අත්තික්කා ගහකින් ගෙඩියක් කඩාගෙන කන්නට උන්වහන්සේ සෙවීය. මෙලොව බිහිවූ ශ්‍රේෂ්ඨතම දේශකයාණන්ට ලෝකයා සත්කාර කලේ එයාකාරයටය. අත්තික්කා ගහේ ගෙඩි නොතිබූ බැවින් කුසගි න්නේම දේවමාළිගාවට ඇතුල්වූ උන්වහන්සේ රැස්වූ සෙනඟට ඉගැන්වූ සේක. වර්ථමාන දේශකයන් වන අපි වේලාවට කෑම ටික නොලැබුනොත් ඉතා උරණ වන්නෙමු. සීනි අඩුවෙන්, ලුණු අඩුවෙන් එළවලු තෙල් යොදා සැකසූ ගුණවත්, රසවත් ආහාර වේලක් සොයමින් අද අපි අපවම සතුටු කර ගන්නෙමුව. එහෙත් අපගේ පරම ආදර්ශය වන යේසුස්වහන්සේ එයාකාර නොවේ.

**"යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නැවත නැගිටීමේ මහිමය" පොතෙන් උපුටා ගන්නා ලදී.**

**කතෘ : නෙවිල් ජයසුන්දර**

**ඉතිරි කොටස - පිටු අංක 11 සිට**

පැහැදිලිවම යම් දෙයක් සිදුවෙමින් පවතී. යක්ෂයා තම අවසන් මුලාව මෙලොව ප්‍රචලිත කරමින් සිටියි. සිනමා ලොවේ මෑත ජනප්‍රිය වූ චිත්‍රපට ගණනාවක් මෙම විෂය තේමා කරගෙන තැනුනි. "ක්ලෝස් එන් කවුන්ටර් ඔෆ් ද තර්ඩ් කයින්ඩ්, ඊ.ටී, ස්ටාර් ට්‍රෙක්, ස්ටාර් වෝර්ස්, ඉන්ඩිපෙන්ඩන්ස් ඩේ, ඇල්ෆ්, ද ඩේ දි අර්ත් ස්ටුඩ් ස්ටිල් සහ අවතාර්" වැනි චිත්‍රපට පිටසක්වල ජීවීන් පිළිබඳ මතය ස්ථිර කිරීමට උත්සහ දරයි.

පිටසක්වල ජීවීන් දර්ශණ වීම පිළිබඳව බයිබලයානුකූල හා නිවැරදි විග්‍රහයන් මෙසේයි.

01. පිටසක්වල ජීවීන් දර්ශණය වීමේ පුවත් වලින් සියයට අනූවකට වඩා මිනිසුන්ගේ මනස්ගාත හෙවත් යම් අය තම සිතින් මවාගෙන පවසන දර්ශණය.

02. වෙනත් සාධාරණ හේතුවක් මත ඇතිවන සිද්ධියක් පිටසක්වල ජීවීන් දර්ශනය වීමක් හැටියට වැරදි වැටහීමකින් විග්‍රහ කිරීමක්.

03. අවසාන කාලයෙහි කූට ලෙස මිනිසුන් මුලා කරවන යක්ෂයාගේ අන්ත ක්‍රියාකිරීමක් කරණකොට ගෙන සිදුවන යක්ෂ ආත්ම ප්‍රදර්ශනයක්.

ඉහත සඳහන් තුන්වන කරුණ අපගේ අවධානයට යොමු කල යුතු වේ. මෙම පරිච්ඡේදයේ කලින් සඳහන් කර ඇති පරිදිම අවසාන මහා බොරුව මගින් මුලු මහත් ලෝකය මුලා කිරීමට යක්ෂයා සැරසෙයි. ස්වාමී වූ යේසුස්වහන්සේ වලාකුලු මතට පැමිණ තම දරුවන් ස්වර්ග යට ඔසවා ගැනීමත් සමගම එම මිනිසුන් පිටසක්වල ජීවීන් විසින් ගෙන ගියේ යැයි ප්‍රකාශ කරණු ඇත. එසේ අතුරුදහන් වූයේ ක්‍රිස්තියානි මිනිසුන් බව යෝජනා කෙරුණත් ඒ වන විට තවම පොළවේ ඉතුරුව සිටින නාමික කිතුණු ජනතාව නිසා එම යෝජනා හා අදහස ප්‍රතික්ෂේප වනු ඇත. ඇතැම් කිතුණු නිකායික නායකයින් හා පූජකවරු පවා රූපවාහිනී, ගුවන් විදුලි සහ අන්තර්ජාල ඔස්සේ එම අදහස ප්‍රතික්ෂේප කරන නිවේදන නිකුත් කරනු ඇත.

ඉහත හේතුව නිසා පිටසක්වල ජීවීන් පිළිබඳ වර්ධනය වන විශ්වාසය අවසාන කාලය පිළිබඳ නිශ්චිත ලකුණක් බව සැලකිය යුතුය. පෙර කවරදාවත් නොවූ විරූ ආකාරයට පිටසක්වල ජීවීන් පිළිබඳ විශ්වාස කිරීමට මනුෂ්‍යයා දැන් පෙළඹී සිටින්නේ මේ නිසාමයි. යක්ෂයාගේ මෙම මුලාවෙන් ගැලවීමට ඇත්තේ එක මඟක් පමණී. යේසුස්වහන්සේ වළාකුලු මතට පැමිණ ඇදහිලිවන්තයන් ඔසවා ගැනීමේ ඒ අපූර්ව සිද්ධියට ඔබත් සූදානම්ව සිටින්න. ස්වාමී වූ යේසුස්වහන්සේව ඔබගේ එකම ගැලවුම්කරුවාණන්වහන්සේ හැටියට විශ්වාස කරන්න.

**"යුගාන්තයක පෙර නිමිති" පොතෙන් උපුටා ගන්නා ලදී**

**- කතෘ : නෙවිල් ජයසුන්දර -**




# සාලමොන්ගේ ගීතය හෙවත් ගීත අතරේ උතුම් ගීතය.

මීට පෙර ලිපියෙහි අපි සාලමොන්ගේ ගීතිකා පොතෙහි, පණිවිඩ සිව් වැදෑරුම් බව, නැතහොත් අර්ථකථන 4 ක් ඇති බව සළකා බැලුවෙමු. ඔබට ඒ අර්ථකතන සතර මතකද? පළමුව එය පිරිසිඳු විවාහක ප්‍රේමය පිළිබඳ ප්‍රකාශනයකි. දෙවනුව තම ගිවිසුමේ ජනතාව වන ඉශ්‍රායෙල්ට දෙවියන්වහන්සේගේ ඇති ප්‍රේමය පිළිබඳ කියැවෙයි. තුන්වෙනි අර්ථකතනය වන්නේ ස්වර්ගීය මනාලි ය වන සභාව කෙරෙහි ඇත්තාවූ ස්වාමීවූ යේසුස්වහන්සේගේ ප්‍රේමයයි. අවසාන වශයෙන් එහි අපට කතාකරන්නේ පුද්ගලික ලෙස අප එකිනෙකා සමග යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඇති සමීප සම්බන්ධතාවයයි. ඔබ මේ පොත කියවන සෑමවිටම මෙය මතක තබා ගත යුතුයි. මාංසික සිතක් ඇත්තාවූ අයට මෙම පොත තේරුම් ගත නොහැක. අලුත ඉපදීම නොලැබූ කෙනෙකුට මෙම පොතේ ඇති දිව්‍ය සැළැස්ම දැකගත නොහැක. එවැනි අය දකින්නේ හුදෙක් මිනිස් ප්‍රේම කථාවකි. නමුත් ඇදහිලිවතුන් වන අපිට මෙහි දිව්‍ය ප්‍රේමය හා දිව්‍ය සත්‍යතාවයන් දැකගත හැකි බව මතක් කරන්ට කැමැත්තෙමි.

මීට පෙර මම සඳහන් කළ පරිදි, මෙම පොත මුලුල්ලෙහි චරිත තුනක් දැකගත හැක. ඔවුන් නම් මනමාලයා වන සාලමොන් රජ, මනාලිය වන ෂූලම්මිය ස්ත්‍රිය හා විටින් විට කතාවේ මැදිහත් වන යෙරුසලමේ දූවරුය. මෙහිදී අප කියවන කොටසේ කතාකරන්නේ කව්රුන්දැයි හඳුනාගැනීම වැදගත් වේ. පළමුවෙනි පරිච්ඡේදයේ පළමුවන පද හතරෙහි, මනමාලි සහ යෙරුසලමේ දූවරුන් පමණක් කතා කරති. නමුත් ඔබ තවදුරටත් කියවාගෙන යනවිට මනමාලයාද කතාකරන බව ඔබට තේරුම් ගත හැක. නමුත් පළමුවෙනි පද හතර තුල අප දකින්නේ චරිත දෙකක් පමණකි.



පළමුවෙනි පදයේ අපට මෙම පොතේ කතෘවරයා හමුවේ. "**සාලමොන්ගේ උතුම් ගීතිකාවය**". දෙවැනි පදයේ මනාලිය කතාකරයි "**ඔහු තමාගේ මුඛයේ සිඹීම්වලින් මා සිඹීවා, මක්නිසාද නුඹේ ප්‍රේමය මුද්‍රික පානයට වඩා හොඳය**".

මෙහිදී මනාලිය, දිව්‍ය ප්‍රේමය වඩා ගැඹුරු ලෙස අත්දකින්නට ආශාකරන බව අපට දැකගතහැක. මෙය මාංසික ප්‍රකාශනයක් යැයි

නොසිතන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. මෙහි අනාවරණය වන සෑම කරුණකම දිව්‍යමය සහ ආත්මික වේ. අපගෙන් කීදෙනෙක් ස්වාමීන්වහන්සේගේ ගැඹුරුතම ප්‍රේමය අත්දකින්නට ආශා කරනවාද? අපට අවශ්‍ය කරන්නේ උන්වහන්සේගේ ආශිර්වාද පමණකි. **"ස්වාමී වූ යේසුස්වහන්සේට බොහෝ සේවකයින් සිටින නමුත් ප්‍රේමවන්තයින් සිටින්නේ අතලොස්සක් පමණකි"** කියා කියමනක් තිබේ. මෙය සත්‍යවූ කියමනකි.

අපි උන්වහන්සේගේ ප්‍රේමය, එහි දිග, පළල, උස, ගැඹුර කිමෙක්ද කියා තේරුම් ගතයුතු බවත් අත්දැකිය යුතු බවත් **එපීස 3:19** පදයේ පැවසේ. එසේම එම ප්‍රේමය කිසි නුවණකින් දැනගත නොහැකි එකක් බව **18 පදයේ** සඳහන්ය. කරුණාකර එම පද දෙක හොඳින් කියවන්න. " **දෙවියන්වහන්සේගේ මුලු පූර්ණකමට පූර්ණ වන පිණිස සියලු ශුද්ධවන්තයන් සමඟ ක්‍රිස්තුස්වහන්සේගේ දැනගත නොහැකි ප්‍රේමය, දැනගෙන එහි පළල, දිග, උස, ගැඹුර කිමෙක්ද කියා තේරුම්ගන්ට නුඹලාට පුළුවන් වන පිණිසත්,..."** ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය මුලු පරිමාණයෙන් තේරුම් ගැනීමෙන් හා අත්දැකීමෙන් පමණක් ඔබට දෙවියන්වහන්සේගේ මුලු පූර්ණකමට පූර්ණ විය හැකි බව ඔබට පෙනෙනවාද? මෙම අදහස කොපමණ වැදගත්දැයි සිතා බලන්න. ක්‍රිස්තුස්වහන්සේගේ මෙම ප්‍රේමය දෙවියන්වහන්සේ එළිදරව් කරන්නේ ඊට සැබෑලෙසම ආශාකරන අයට පමණකි. අනිත් අයට උන්වහන්සේගේ ප්‍රේමයේ මතුපිට අත්දැකීමක් පමණක් ලබාගත හැක.

ඉන්පසු සාලමොන්ගේ ගීතිකා පොතේ 1වන පරිච්ඡේදයේ 2 වන පදයේ 2වන වාක්‍යයේ **"මක්නිසාද ඔබේ ප්‍රේමය මුද්‍රිකපානයට වඩා මිහිරි"** බව පැවසේ. ශුද්ධ බයිබලයේ මුද්‍රිකපානයෙන් අපට කතාකරන්නේ මනුෂ්‍ය ප්‍රීතිය පිළිබඳවයි **"මනුෂ්‍යයාගේ සිත සතුටුකරන මුද්‍රික පානයත්, ......" ගීතාවලිය 104:5** හි සඳහන් වේ. මෙහිදී මනමාලිය උන්වහන්සේගේ ප්‍රේමය මුද්‍රිකපානයට වඩා මිහිරි බව පවසයි. ඔව්, උන්වහන්සේගේ ප්‍රේමය හුදෙක් අපගේ සිත සතුටු කරනවා පමණක් නොව, දෙවියන්වහන්සේගේ අභිප්‍රායන් ඉෂ්ඨ කරයි. අප කෙරෙහි ඇති දෙවියන්වහන්සේගේ ප්‍රේමය පිළිබඳව බයිබලය පවසන්නේ කුමක්දැයි ඔබ දන්නවාද?

### උන්වහන්සේගේ ප්‍රේමය සදාකාලිකයි (යෙරමියා 31:3)

අපි උපදින්නටත් පෙර සිටම, දෙවියන්වහන්සේ අතීත සදාකාලයේ පටන් අපට ප්‍රේමකල බව මෙයින් අදහස් කෙරේ.

### උන්වහන්සේගේ ප්‍රේමය පරිත්‍යාග ශීලියි - (යොහාන් 3 :16)

**"උන්වහන්සේ දුන් සේක".** දෙවියන්වහන්සේ පුත්‍රයාණන්වහන් සේව දුන්සේක. පුත්‍රයාණන් උන්වහන්සේගේ ජීවිතය දුන් සේක.

### මැනිය නොහැකි නොහොත් ගැඹුර දැනගත නොහැකි උන්වහන්සේගේ ප්‍රේමය - (මතෙව් 27:46)

යේසුස්වහන්සේ මෙම වචන

පැවසූසේක. **"මාගේ දෙවියනි, මාගේ දෙවියනී ඔබ මා අත්හැරියේ මක්නිසාද"** ඔබටත් මටත් ඇති එම ප්‍රේමය නිසා උන්වහන්සේ එම වේදනාත්මක අත්දැකීම තුලින් යන්නට කැමති වූසේක.

උන්වහන්සේගේ ප්‍රේමයට කෙළවරක් නැත. නොමියෙන ප්‍රේමයකි. එය ගිව්සුම් ප්‍රේමය කියාද විස්තර කළහැක. දෙවියන්වහන්සේගේ මෙම ප්‍රේමය වෙනස්වන්නේ නැත. ඔබ අද කුමන තත්වයේ සිටියද උන්වහන්සේගේ ප්‍රේමය නොවෙනස්ව පවතී. අපට මනුෂ්‍යයන් සිදුකරන හෝ නොකරන දේවලට අනුව අපි ඔවුන්ට ප්‍රේම කරමු. නමුත් දෙවියන්වහන්සේ එලෙස ප්‍රේමකරන්නේ නැත. උන්වහන්සේගේ මෙම ප්‍රේමය ප්‍රකාශ කෙරෙන විශේෂ හෙබ්‍රෙව් වචනයක් පරණ ගිව්සුමේ තිබේ. එනම් "ඛෙසෙඩ්" (KHEZED). ඉංග්‍රීසි බයිබලයේ මෙම වචනය පරිවර්තනය කර ඇත්තේ " දෙවියන්වහන්සේගේ කරුණා ගුණය" ලෙසටයි. අද ඔබ උන්වහන්සේට අකීකරු වූවා හෝ උන්වහන්සේව ශෝකයට පත්කලා යැයි සිතේ නම්, උන්වහන්සේ ඔබට දක්වන ප්‍රේමය කිසිසේත් නොවෙනස්ව පවතින බව කරුණාකර මතක තබාගන්න. මේ නිසා ඔබ පසුතැවිලි වී ආපසු උන්වහන්සේ වෙතට යා යුතුයි. උන්වහන්සේ බහුලව ඔබට කමාවන සේක.

උන්වහන්සේගේ ප්‍රේමය පෞද්ගලිකයි. උන්වහන්සේගේ ප්‍රේමය අප එක් එක්කෙනා කෙරෙහි තනි තනි වශයෙන් යොමුව පවතී. ස්වාමීවූ යේසුස්වහන්සේ තරුණයෙකු දෙස බලා ඔහුට ප්‍රේමකල බව **මාර්ක් 10:21** හි සඳහන් වේ. උන්වහන්සේ ලාසරුස්ටද ප්‍රේමකල බව **යොහාන් 11:30** හි අප කියවමු. ඔව්, අපගේ ස්වාමීන්වහන්සේ පුද්ගලිකව අපට ප්‍රේම කල අතර තවමත් පුද්ගලිකව ප්‍රේම කරන සේක. උන්වහන්සේගේ මුලු ප්‍රේමය අප එක් එක්කෙනා කෙරෙහි යොමුව පවතින බව ඉන් අදහස් කරයි. උන්වහන්සේගේ සියලු දේ අපට කරන්නේ ප්‍රේමයෙනි. එම නිසා **"ඔබගේ ප්‍රේමය මුද්‍රිකපානයට වඩා හොඳය"**, කියා අපට සැබවින්ම කිවහැක. එසේම **ගීතාවලිය 63:3** හි සඳහන්, **"ඔබගේ කරුණාගුණය ජීවිතයට වඩා යහපත්"** යන පදයද අපට මතක් කරගත හැක.

දැන් අපි තුන්වනි පදය දෙසට යොමුවෙමු. මෙම වචන පවසනු ලැබුවේ යෙරුසලමේ දූවරුන් විසිනි. **"ඔබේ විලවුන් මිහිරි සුවඳින් යුක්තය, ඔබේ නාමය වැගිරෙවූ විලවුන් මෙන්ය, එබැවින් කන්‍යාවෝ ඔබට ප්‍රේම කෙරෙති"**. මෙහිදී අපට යෙරුසලමේ දූවරු මනමාළයාගේ නාමය වර්ණනා කරන ආකාරය දැකගත හැක. අපගේ ගැළවීමට අවශ්‍යවූ එකම නාමය ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයයි. **ක්‍රියා 4:12 "වෙන කිසිවෙකු තුළ ගැළවීම නැත්තේය. මක්නිසාද අපේ ගැළවීම අවශ්‍යවූ, මනුෂ්‍යයන් අතරේ දෙන ලද වෙන නාමයක් ස්වර්ග යෙන් යට නැත්තේය"**.

ඉන්පසු අපට තුන්වන පදයේම "විලවුන්" පිළිබඳව දැකගත හැක. විලවුන් යනු ආලේපයකි. මෙහිදී විලවුන් මඟින් අපට යෝජනා කෙරෙන්නේ, සම්පූර්ණයෙන්ම එකට සංයෝගවූ සියලුම ගුණාංගවලින් හෙබි ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතයයි. විලවුන් හෝ ආලේපය හෝ

තෛලය සාදනු ලබන්නේ පොඩි කිරීම හා ඇඹරීම යන ක්‍රියාවලියක් තුලිනි. මෙවැනි ආකාර දුක්විඳීමේ විනය තුලින්, ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය මිහිරි සුවඳින් යුක්ත වූ වැගිරෙවූ විලවුන් බවට පත්ව තිබේ. දේව පුත්‍රයාණන්ගේ මිහිරි සුවඳින් පිරි ජීවිතය, බොහෝ දෙනාගේ ජීවිත සුවඳවත් කර තිබේ.

හතර වෙනි පදය දෙසට අපි දැන් අවධානය යොමු කරමු. මෙම පදය කොටස් තුනකින් යුක්තය. පළමුව **"මා ඇදගනින්න"** යනුවෙනි. මෙහිදී කතාකරන්නේ මනමාලියයි. ස්වාමින්වහන්සේ ඔබව මිදීමේ ප්‍රේමයේ රැහැන්වලින් ඇදගෙන තිබෙනවාද? අප මෙම යාච්ඥාව නිරන්තරයෙන්ම කළ යුතුයි. **"ස්වාමීනි ඔබ පසුපස මා ඇදගත මැනව!"** එසේ නොමැති නම් මේ ලෝකයේ නිෂ්ඵල යස ඉසුරුවලින් අපව ඇදගනු ලබනවා ඇත. ස්වාමීන්වහන්සේ අපගෙන් ඉල්ලන එකම දෙය නම් **"උන්වහන්සේ අනුගමනය"** කිරීමයි. අන්ද්‍රෑ සහ පේත්‍රුස්ගෙන් ද, යොහාන් සහ යාකොබ්ගෙන් ද උන්වහන්සේ ඉල්ලා සිටි පළමු ඉල්ලීම එය බව ඔබට මතකද? එම වචන කෙතරම් බලවත්ද?, **"මා අනුව එන්න"** ඔවුන් සියල්ල අත හැර උන්වහන්සේ අනුව ගියහ. අපි ස්වාමීන්වහන්සේගේ සැබෑ අනුගාමිකයෝද? අපි උන්වහන්සේ දෙසම පමණක් බලමින් තරඟය දුවන්නෙමුද? අපගේ ජීවිතයේ වෙනත් වීරයන් අපට සිටිනවාද? වෙනත් එවන් කිසිම කෙනෙකු අපට නොසිටිය යුතුයි. හැකිතාක් සමීපවම අපි උන්වහන්සේ සමඟ ගමන් කළ යුතුයි. හතරවන පදයේ ඇති ඊළඟ කොටස **"අපි ඔබ අනුව දුවන්නෙමුව"** කියාය. මෙම වචන යෙරුසලමේ දූවරුන්ගේය. **"අපි දුවන්නෙමුව"** යන වචන සැළකිල්ලට ගන්න. එක ඇදහිලිවන්තයෙක් ආත්මික පිබිදීමක් ලත් විට, එය අනිත් ඇදහිලිවතුන්ටද බලපෑමක් ඇති කරයි. ස්වාමීන්වහන්සේ කෙරෙහි ඇති අපගේ පිවිතුරු භක්ත්‍යාදරය මගින් අනිත් අයද ධෛර්යමත් කරන්නට පුලුවන. **"අපිත් ඔබ අනුව දුවන්නෙමු"** කියා ඔවුනුත් කියනවා ඇත.

පසුව අපි එම පදයේ මනාලියගේ අත්‍යාලංකාර අත්දැකීම පිළිබඳව කියවමු. **"රජ තමාගේ ඇතුල් ගෙවලට මා පැමිණෙව්වේය".** දෙවිපියාණන්ගේ අබිමුඛයටම ළඟාවීමට සෑම ඇදහිලිවන්තයෙකුටම තිබෙන අද්විතීය වරප්‍රසාදය පිළිබඳව මෙයින් අදහස් කෙරේ. අපි එහි ළඟාවන්නේ උන්වහන්සේගේ අභිමුඛය හා ප්‍රේමය භුක්ති විඳීමටයි. අපි දනපතාම එසේ ළඟා වෙනවාද? **හෙබ්‍රෙව් 10:19-22** කියවන්න. කෙතරම් ආශිර්වාදලත් අත්දැකීමක්ද?

**සාලමොන්ගේ ගීතිකා 1 වෙන පරිච්ඡේදයේ,** පළමු පද හතරින් කෙතරම් දේවල් ඉගෙනගත හැකිදැයි ඔබට දැන් පෙනෙනවා ඇති. දෙවියන්වහන්සේගේ අනර්ග වචනය අගය කොට සළකන පිණිස ස්වාමීන්වහන්සේ අපට ආත්මික අවබෝධය ලබාදෙන සේක්වා. අපගේ ස්වර්ගික මනාලයා අපව සනසා උන්වහන්සේගේ අනර්ග ප්‍රේමය අප කෙරෙහි දක්වන සේක්වා!

**- ඈන් ජයසුන්දර -**

# ජීවිත සාක්ෂිය

මහනුවර ගලහ ප්‍රදේශයේ අන්‍යාගමික පවුලක තුන්වන දරුවා ලෙස මම උපත ලැබීමි. මාගේ පවුලේ සියලුම සහෝදර සහෝදරියන් හත් දෙනෙකු වූ අතර අපි දිළිඳු පවුලක් ලෙස දිවි ගෙවිවෙමු. මාගේ පියා රියදුරෙකු වූ අතර මාසයකට හෝ දෙකකට වරක් ඔහු අප බලන්නට නිවසට පැමිණි අතර මගේ මව අපව රැකබලා ගැනීමට නිවසේ සිටියාය. වැඩි දැනුම් තේරුමක් නැති ඇය නිතරම කාලය ගත කළේ තනිවම කල්පනාවේ යෙදීමෙනි. වැඩිමහල් සහෝදරිය වූ මට මගේ කුඩා සහෝදර සහෝදරියන් රැකබලා ගැනීමට නිරායාසයෙන්ම සිදුවිය. ඒ ඔවුන් මගේ මවගෙන් බලාපොරොත්තු විය යුතු සියලු දේ බලාපොරොත්තු වූයේ මා තුළිනි. එමනිසා ඔවුන්ගේ වැඩකටයුතු වාගේම ඔවුන්ව පෝෂණය කිරීමේ වගකීමද මා පිට පැටවුණි. නිවසේ සියලු වැඩකටයුතු සහ සහෝදර සහෝදරියන්ගේ වැඩකටයුතු වලින් මුලු දවසම කාර්යබහුල වූ මා කඩිසර සහ ධෛර්යවත් ගැහැණියක් බවට පරිවර්තනය වෙමින් තිබුණි. මේ සියලු බර වගකීම් නිසා මට පාසල් අධ්‍යාපනයක් ලැබීමේ භාග්‍යයක් නොවිණ.

මම යන්තම් වයස අවුරුදු 17 ක් පමණ වන විට මා කිසිදා නොදුටු මනුෂ්‍යයකුට විවාහකර දීමට තීරණය කරගත් වැඩිහිටියන් ඔවුන් විසින් තීරණය කරගත් දිනක චාරිත්‍රානුකූල විවාහ මංගල්‍යයකින් මා විවාහ කර දුන්නේය. විවාහයෙන් පසු මා මාගේ නැන්දම්මාගේ නිවසට ගිය අතර, එහි ජීවිතය මා සිතූ තරම් හෝ මට කියාදුන් තරම් මිහිරි නොවීය. ජීවිතයේ මොනතරම් කරදර, දුක මා ඉදිරියට පැමිණියාත් ඒ සියල්ල ඉවසීමෙන් නිශ්ශබ්දව දරා ගැනීමට දෙවියන්වහන්සේ මට දී තිබූ ධෛර්ය ගැන අදටත් මට පුදුමය.



මගේ සැමියා මත්පැන් පානයට ඇබ්බැහි වී තිබූ අතර විවාහයෙන් පසු මට ගෙවා දමන්නට වූයේ අන්ත අසරණ ජීවිතයක් යැයි කීවොත් මා නිවැරදිය. මෙසේ කාලය ගත වන විට 1983 වර්ෂයේ රටේ හටගත් කළබලකාරී තත්වය නිසා බොහෝ සරණාගත කඳවුරු වල ජීවත්වන්නට මටත් මගේ ස්වාමිපුරුෂයා ටත් සිදුවිය. ඒ වන විට අපි විවාහ වී වසර කිහිපයක්

ගතව තිබුනත් අපට දරුවන් සිටියේ නැත. දරුවකු ඉල්ලා කෝවිල්, පල්ලි වල භාර භාර වෙමින් භාස්කම් බලාපොරොත්තුවෙන් අපි නොගිය තැනක් නැතිතරම්ය. එක් සරණාගත කඳවුරකදී මට දෙවියන්වහන්සේ ගැන මුලින්ම අහන්නට ලැබුන අතර, මා සුභාරංචියට වැඩි උනන්දුවකින් ඇහුම්කන් නුදුන් අතර මට ඕනෑ වුනේ දෙවියන්වහන්සේ අදහාගැනීම තුළින් හෝ අපට දරුවෙකු ලැබේවි කියායි. පසුව අපි වැල්ලවත්ත ප්‍රදේශයේ ඉතා කුඩා නිවසක ජීවත් වන්නට පටන් ගත් අතර මට මගේ කුළුදුල් පුතා ලැබිණි. මේ කාලය තුලදී දෙවියන්වහන්සේ මා තුළ මගේ හදවතේ ක්‍රියාකරන්නට පටන්ගෙන තිබූ අතර, අප සමඟ ජීවත් වූ තවත් කිතුණු සහෝදරයෙක් අපිව සභාවට යොමුකිරීමට සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට අපව දිනාගැනීමට බොහෝ උත්සහ කළේය. පසුව ඔහු අපිව සභාවට ගෙනයාමට සමත් වූ අතර එහිදී මම මාගේ සිත යේසුස්වහන්සේට භාරදීමට තීරණය කළෙමි. මම මහා පව්කාරියෙක් බව තේරුම්ගත් මා මාගේ පව් උන්වහන්සේට කියා දී උන්වහන්සේගේ ශ්‍රී රුධිරයෙන් සේදී පව් වලට කමාව ලද්දෙමි.

මාගේ ස්වාමි පුරුෂයා පසුව ගැළවීම ලැබූ අතර ඔහු මත්පැන් පානය සම්පූර්ණයෙන්ම අතහැර බයිබලය කියවීමටත්, ඉගෙන ගැනීමටත්, නමස්කාර කිරීමටත් මහත් කැපවීමෙන් නැඹුරු විය. දෙවියන්වහන්සේට බොහෝ ප්‍රේමකළ ඔහු වසර කිහිපයකට පෙර ස්වර්ගස්ථ විය. ගැළවීම ලැබීමෙන් පසුව මටත් මගේ ස්වාමිපුරුෂයාටත් ජීවිතය ජීවත් වීමට බොහෝ වෙහෙස වීමට සිදුවූ අතර දරුවන් හතර දෙනා උදෙසා අපි බොහෝ කැපවීමෙන් වෙහෙසුනෙමු. උන්වහන්සේ අදහා ගැනීමෙන් අපි ක්ෂණිකයෙන් සියලු සැපසම්පත් ලබා නොගත් අතර ඒ වෙනුවෙන් පවුලක් ලෙස අපට තිබුණා වූ පුදුමාකාර ප්‍රීතිය, උන්වහන්සේ තුළ අපව ගොඩනැගුවේය. සභා පරිසරයෙහි අපේ දරුවන් ගොඩනැගුණු අතර බයිබලය කියවීම එයට සවන්දීමට සහ සැබෑ නමස්කාර කරන්නියක් ලෙස උන්වහන්සේ මා වෙනස් කළ සේක.

අදවන විට මාගේ වැඩිමහල් දරුවන් වැඩිහිටියන් බවට පත්ව, විවාහව සිටින අතර මා තවමත් ප්‍රීතියෙන් උන්වහන්සේට ළංව ජීවත්වන්නට උත්සහ කරමි. උන්වහන්සේ නැති කළ, මා ධෛර්යවන්ත ගැහැණියක් ලෙස බොහෝදෙනා හැඳින්වූවත් එය නිශ්ඵල බව උන්වහන්සේ අදහා ගැනීමෙන් පසු මම තේරුම් ගත්තෙමි. සැබෑ වාසනාව නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ රුධිරයෙන් සේදී පව්කමාව ලැබීමය. සැබෑ ධෛර්ය නම් ක්‍රිස්තුස්වහන්සේ මා ළඟ සිටීමේ ධෛර්ය යයි.

**- රාජේෂ්වරී රාමනාදන් -**

# ස්වර්ගයට යා හැක්කේ කෙසේද?

**"මේ මං කරන පිං කන්දරාව මදෑ මම හත් අට පාරක්ම දිව්‍ය ලෝකේ යන්න"**

**"තන්හාව වස්තු කන්දරා එකතු කලාට මදි. ඒ ලෝකේ ගැනත් ඔහේ ටිකක් හිතනවා"**

ස්වර්ගය ගැන සහ ස්වර්ග යට ප්‍රවිෂ්ටවීම ගැන බොහෝ අයගේ අදහස් සහ මත විවිධාකාරයි. කෙසේ වෙතත් පොදුවේ ගත්කල ස්වර්ගයක් තිබේ යන ඒකායන විශ්වාසය සෑම දෙනෙකු තුළම පවතී.

**"සෑම යහපත් මිනිසෙකුම ස්වර්ගයට යන්නේය"** යන යහපත් කියමන අප අසංඛ්‍ය වාර ගණනක් අසා ඇත. මෙම ප්‍රකාශනයෙහි ඇති අර්ථාන්විත භාවය සහ තර්කානුකූල භාවය ඉතාම ප්‍රත්‍යක්ෂ දෙයක් බව බැලූබැල්මට ඔබට පෙනෙන්නේ නම්, ඔබේ පරිකල්පනාව සාවද්‍ය නැත. මක්නිසාද සෑම යහපත් කෙනෙක්ම ස්වර්ගයට යා යුතුයි.

එහෙත්.... තවත් එක් ප්‍රශ්නයක් තිබේ. පිළිතුරු සෙවිය යුතුයි. ඊනියා හොඳකම, යහපත්කම "කොයිතරම් දුරට" යහපත් විය යුතුද?

හදවත කකියන තරම් සංවේගාත්මක කල්පිතයක් බොහෝ අයගේ සිත්වල පවතී. මිනිසෙකු මෙලොව වාසය කරන ජිවිතයේ ඇති යහපත්කමක් ඔහු යම් දිනක සදාකාලයේ ගත කිරීමට යන ජීවිතයත් අතර ඍජු සම්බන්ධතාවයක් තිබේය කියන්නාවූ අන්ධ විශ්වාස, අහෝ මුලාවක මහත, අහස පොළොව ඇතුලු මිනිසාද මැවූ දෙවියන්වහන්සේද පවසන්නේ ස්වර්ගයට ඇතුලු වීමට තරම් " යහපත්" වූ කිසිදු මිනිසකු නැත.



එහෙත් මෙම දෙවියන්වහන්සේගේම පුත්‍රා වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ එදා එම රුදුරු කුරුසිය මත ඔබේත් මගේත් පව්වල දඬුවම ගෙවමින් එල්ලී සිටින අතර, උන්වහන්සේ අසලම තවත් කුරුසියක් මත එල්ලී සිටි අපරාධ කරුට යේසුස්වහන්සේ කීවේ කුමක්ද? **"අදම නුඹ මා සමඟ පාරාදීසයේ සිටින්නේය".** ස්වර්ගික උරුමය ලැබීම සඳහා මෙම අපරාද කරු කලේ කුමක්ද? කුරුසියෙන් බැස ඇවිත් යම්කිසි කාල සීමාවක් නැවත වරක් මෙලොව "යහපත්" ජීවිතයක් ගත කිරීමද ඔහු කලේ? නැහැ ඒ මොහොතේ ඔහු හුදෙක් අපරාධකරුවෙකු පමණී. ඔහු කළ හොඳක් නැත. තවමත් අපරාධකරුවෙකු, පව් කරුවෙකු නොහොත් අයහපත් මිනිසෙකු ලෙස සිටියදීම ඉතා සරල ක්‍රියාවක් ඔහු කළේය. බලන්න ඔහු කළ දේ කෙතරම් පුදුම සහගතද? ඔබටත් ඒ දේ කළ හැකිදැයි බලන්න. ඔහු කලේ යෙුස්ස්වහන්සේ කව්රුන්ද සහ එම තැනැන්වහන්සේ ඔහුට අවශ්‍ය බව තමාගේ සිතේ මුලු අවංක කමින් පිළිගැනීම පමණී.

මරණින් මතුවට එළඹෙනා ඔබගේ සදාකාලික ජීවිතය ඔබ ගත කිරීමට යන්නේ කොහිද යන සිතට වද දෙන ප්‍රශ්නයට ස්ථිර සාර පිළිතුරක් ලබා ගැනීමට අවශ්‍ය නම් මෙන්න මේ දේ කරන්න. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබේ ගැලවුම්කරු බව පිළිගන්න. මේ සඳහා ඔබ දැන් සිටින තත්වය වැදගත් වන්නේ නැත. නැවත සිතන්න කුරුසියේ අපරාධකරු ගැන. බයිබලයෙහි සඳහන් වන සාකෙවුස් නම් පව්කාර බදු එකතු කරන්නා ගැන සිතන්න. ඔවුන් යේසුස්වහන්සේ වෙතට පැමිණියේ ඔවුන්ගේ වැරදි හරිගස්සා ගෙන කාලාන්තරයක් පුරා යහපත් ජීවිතයක් ගත කිරීමෙන් අනතුරුව නොවේ. ඔවුන් පැමිණියේ ඔවුන් සිටිය තත්වයෙන්මයි. එනම් තවමත් කුරුසියේ අපරාධකරු සහ පව්කරු බදු අයකරන්නා වශයෙනි. යේසුස්වහන්සේ වෙතට පැමිණීම සඳහා ඔබ තුළ තිබෙන "යහපත්කම" නොවේ. එකම සුදුසුකම ඔබ තුළ තිබෙන "අයහපත්" කමයි. එනම් ඔබ "පව්කරුවෙකු" බව අවංක ලෙස ඔබම පිළිගෙන තිබීම පමණී. අදම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබේ සිතට පිළිගන්න.

**- ඇලෙක්ස් පෙරේරා -**

- ලෝකාලෝකය සඟරාව තවත් අයට හඳුන්වා දෙන්න.
- ඔබගේ කිතුණු යහලුවන්ගේ ලිපිනය අපට SMS කරන්න - 077 8813197 (එවිට සඟරාව තැපැල් මාර්ගයෙන් ඔවුන්ට යවනු ලැබේ).
- අපගේ මධ්‍යස්ථානයේ පැවැත්වෙන රැස්වීම් වලට Face Book , You Tube ඔස්සේ සම්බන්ධ වන්න.
- දුරකථනය ඔස්සේ ඔබගේ යාච්ඤා ඉල්ලීම් අප වෙත දන්වන්න.
- ඔබත් දිනපතා බයිබලය කියවා දේව වචනය ඉගෙන ගන්න.
- දිනපතාම යාච්ඤා කරන්න.

www.christianfellowshipcentre.com

Cfc Colombo (Christian Fellowship Centre)

Christian Fellowship Centre


ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
අංක - 07, විවේකානන්ද පාර,
වැල්ලවත්ත,
කොළඹ 06.
දුරකථන අංක : 011 2 581 901 / 077 8 813 197



NMA GRAPHICS
No. 246/1, Galle Road, Ratmalana.
Tel: 011 2 730 644 / 071 4 286 295 / 077 4 223 020
E-mail : nmagraphics2001@gmail.com